# සී/ස ලංකා නැව් සංස්ථාව

## වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය

# ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා පවතින ඇබෑර්තුව පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ගොඩබිම් නම්කළ තැනැත්තා තනතුර - කොන්ත්‍රාත් පදනම (ඇබෑර්තු)**

**සුදුසුකම්** :- කපිතාන්වරයෙක් (Master) ලෙස 1 වෙනි පන්තියේ නිපුණතා සහතිකය (COC)
කපිතාන්වරයෙක් (Master Mariner) වශයෙන් අවම වශයෙන් **වසර 03 පළපුරුද්ද**
(විශේෂයෙන් තොග බහාලුම් නෞකා වල )

**පළපුරුද්ද** :- පිළිගත් නැව් හිමි මෙහෙයුම් සමාගමක ගොඩබිම් නම්කළ තැනැත්තෙකු (DPA තනතුර) ලෙස **අවම වශයෙන් වසර 01ක පළපුරුද්ද**

**වැටුප** :- මාසික දීමනාව **රු. 450,000/-** ට අමතරව රජයේ චක්‍රලේඛනයන්ට අනුව ප්‍රවාහන පහසුකම් සහ ඉන්ධන දීමනා

## රැකියා විස්තරය

**වගකීම්**

- ආයතනයේ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (SMS) සන්නිවේදනය කිරීම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික අංශය සමග සාකච්ජා කොට කපිතාන්වරු සහ ආයතනයේ කළමනාකාරීත්වයට උපදෙස් දීම හා සම්බන්ධිකරණය කිරීම.
- තාක්ෂණික අංශ ප්‍රධානියා සමග සාකච්ජා කර (in consultation) නැව් සංස්ථාවේ සියලුම නැව් වල වෙරළාශ්‍රිත හා නැව හා සම්බන්ධ (both shore board & on board) ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය(SMS)/ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
- විවිධ නැව් වාර්තා නිරතුරුව පරීක්ෂා කරමින් නැව් වල මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම.
- නැවේ ආරක්ණ කළමනාකරණ පද්ධතිය අධික්ෂණය (SMS) සහ වැඩි දියුණු කිරීම සහ නැවේ වාර්තා කිරීම් (Ship Board Recording) පසු විපරම් කිරීම.
- සියලුම ව්‍යවස්ථා හා වර්ගීකරණ සමාජ සමීක්ෂණ (Classification Society Surveys) සම්බන්ධයෙන් නියෝග දීම සහ නියමිත වෙලාවට ක්‍රියාත්මක කිරීම.
- ප්‍රමාණවත් සම්පත් සහ ආයතනය මගින් ලැබිය යුතු වෙරළ ආශ්‍රිත (shore based support) අවශ්‍ය සහයෝගය සැපයීම තහවුරු කිරීම සහ අලුත් වැඩියා හා අමතර කොටස් ප්‍රසම්පාදනය තහවුරු කිරීම.
- ගොඩබිම් නම්කළ නිලධාරී (DPA තනතුර) කටයුතු ඇගයීම නිරීක්ෂණය කිරීම විශේෂයෙන් දුරස්ථව හා අඛණ්ඩව නිරීක්ෂණය කිරීම නැවේ ආරක්ෂිත කළමනාකරණ පද්ධතියේ (SMS) සඵලතාවය සමාලෝචනය කිරීම.
- නැව් කාර්ය මණ්ඩලය කලමනාකාරීත්වයේ අඩුපාඩු නොගැළපීම්, අනතුරු හා අනතුරු දායක සිදුවීම් වාර්තා කිරීම, විමර්ශනය කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- කළමනාකරණ සමාලෝචන කමිටු රැස්වීම් සංවිධානය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා එහි වාර්තා තැබීම හා නඩත්තු කිරීම.
- International Maritime Organization අවශ්‍යතාවයන්ට අනුකූලව සහ නූතන මාර්ගෝපදේශ අනුගමනය කරමින් අදාළ බලධාරීන්ට අවශ්‍ය වූ විට අතිරේක අත් පොත් (additional manuals) සම්පාදනය කිරීම.
- හදිසි අවස්ථාවන් ආවරණය වන පරිදි ship/ show contingency plans සමාලෝචනය කිරීම හා සම්පාදනය කිරීම.
- ජාත්‍යන්තර රෙගුලාසි වලට අනුකූලව නාවික හා නැව් මත (Marine shipboard) ආරක්ෂාව සහ පාරිසරික ප්‍රතිපත්ති සුරක්ෂිත කිරීම.
- තාක්ෂණික දෙපාර්තුමේන්තු ප්‍රධානියා සහ චාටරින් සහ ඒජන්සි දෙපාර්තුමේන්තු ප්‍රධානීන් සමග සම්බන්ධීකරණය වෙමින් නැව් කපිතාන්වරුන් (Masters) වෙත මුහුදු ගමන් පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
- විදේශීය වරාය නියෝජිතයින් (Foreign Port Agency) වෙත උපදෙස් ලබාදීම.

**වයස් සීමාව** :- වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ/සේ.නි.භා.අ.
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගතකිරීම් රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණය
4. සන්නිවේදන වියදම් ආපසු ගෙවීම්

**පොදු උපදෙස්**

- සියලුම අයදුම්පත් සමග අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල පිටපත් තමා විසින්ම සහතිකකොට උප්පැන්න සහතිකය හා අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් **මෙම දැන්වීමේ දින සිට දින 10 ක්** ඇතුළත සභාපති, **සී/ස ලංකා නැව් සංස්ථාව, නො.27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** ලිපිනයට හෝ chairman@cscl.lk /hr@cscl.lk යන විද්‍යුත් තැපෑලට ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.


**සභාපති,**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව,**
**අංක 27, MICH ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය),**
**කොළඹ 01.**

**වැඩි විස්තර සඳහා (+94) 011 239 4624 / දිගුව 218 - නීති /රක්ෂණ සහ මානව සම්පත් අංශය**